‘ඔබේ අත් දෙකින් මෙසේ සිදු කිරීම ඔබට ප්රමාණවත් වන්නේය’ යැයි පවසා පසුව තමන්ගේ අත් දෙක පොළව මත එක් වරක් ගසා, පසුව වම් අතින් දකුණත ද එතුමාගේ අත් දෙකෙහි මතු පිට ද එතුමාගේ මුහුණ ද පිරිමැද්දාහ

අම්මාර් ඉබ්නු යාසිර් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් වාර්තා කරන ලදී. “යම් අවශ්යතාවක් සඳහා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මා එව්වේය. එවිට මා ජුනුබ් තත්ත්වයට පත්ව සිටියෙමි. නමුත් මට ජලය ලැබුණේ නැත. පසුව මම සතුන් පෙරළෙන්නාක් මෙන් පිරිසිදු දූවිලි පසෙහි පෙරළුණෙමි. පසුව මම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා වෙත පැමිණ එතුමාට ඒ ගැන සඳහන් කළෙමි. එවිට එතුමා ‘ඔබේ අත් දෙකින්
මෙසේ සිදු කිරීම ඔබට ප්රමාණවත් වන්නේය’ යැයි පවසා පසුව තමන්ගේ අත් දෙක පොළව මත
එක් වරක් ගසා, පසුව වම් අතින් දකුණත ද එතුමාගේ අත් දෙකෙහි මතු පිට ද එතුමාගේ මුහුණ
ද පිරිමැද්දාහ.
[صحيح] [متفق عليه]

යම් අවශ්යතාවක් සඳහා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අම්මාර් ඉබ්නු යාසිර් (රළියල්ලාහු අන්හු) තුමාව යැව්වේය. එවිට ඔහු ජුනුබ් තත්ත්වයට පත් විය. එනම් සංසර්ගය හේතුවෙන් හෝ කාමුක හැඟීමෙන් ශුක්රාණු පිටවීම හෙතුවෙන් එවන් තත්ත්වයකට පත්විය. නමුත් ස්නානය කිරීම සඳහා ජලය ඔහුට නොලැබුණේය. ජනාබත් තත්ත්වයෙන් පිරිසිදු වීමේ තයම්මුම් නීතිය ඔහු දැන සිටියේ නැත. සැබැවින්ම හෙතෙම දැන සිටීයේ සුළු කිලිට්ටෙන් පිරිසිදු වීමේ ක්රමය පමණි. පසු ව ඔහු එහි නීතිය සොයන්නට උත්සාහ කළේය. සුළු කිලිට්ටෙන් මිදීමට වුළූ හි ඇතැම් අවයව පොළව මත ඇති පසින් පිරිමදින්නාක් මෙන් ජනාබත් හේතුවෙන් මුළු ශරීරයම පසින් ආවරණය කළ යුතු යැයි සිතුවේය. හෙතෙම එය ජලයට සැසඳුවේය. පසුව මුළු ශරීරයම ආවරණය වන පරිදි පස් මත පෙරළුණේය. පසු ව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා වෙත පැමිණි කල්හි තමන් කළ දෑ නිවැරදි ද නැද්ද යන්න දැන ගැනීම සඳහා එතුමාණන්ට ඒ ගැන සඳහන් කළේය. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මූත්රා පිටවීම වැනි හේතුවකින් ඇති වන සුළු කිල්ලෙන් හා ජනාබත් වැනි හේතුවකින් ඇතිවන මහා කිල්ලෙන් පිරිසිදු වීමේ ක්රමය පැහැදිලි කළහ. එනම් තම අත් දෙක පොළව මත එක් වරක් ගසා, පසුව වම් අතින් දකුණත ද එතුමාගේ අත් දෙකෙහි මතු පිට ද එතුමාගේ මුහුණ ද පිරිමැද පෙන්වූහ.

http://sunnah.global/hadeeth/si/show/3461